

2024

කාර්යසාධන වාර්තාව

රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව

මහා භාණ්ඩාගාරය

මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

2024 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව
රාජ්‍ය මුද්‍රල් දෙපාර්තමේන්තුව

වැය ශීර්ෂ අංකය: 245

අන්තර්ගතය

පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

පරිච්ඡේදය 02 – ප්‍රගතිය හා ඉදිරි දැක්ම

පරිච්ඡේදය 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

පරිච්ඡේදය 04 – කාර්යසාධන දර්ශක

පරිච්ඡේදය 05- තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ

පරිච්ඡේදය 07– අනුකූලතා වාර්තාව

01. පරිච්ඡේදය - ආයතනික පැනිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1. හැඳින්වීම:

රටෙහි ආර්ථිකයට ක්ෂණික බලපෑම් ඇති කරන ආකාරයෙන් රාජ්‍ය සම්පත් එනම් රාජ්‍ය ආදායම සහ වියදම කළමනාකරණය කරන ආකාරය, රාජ්‍ය මුදල් කළමනාකරණය විෂය හා සම්බන්ධ වේ. සාමාජීය අවශ්‍යතා රජය සතුව පවතින සම්පත්වලට වඩා වැඩි බැවින්, ආර්ථික හානි හා අපතේ යාම් අවම වන ආකාරයෙන් සියලුම රාජ්‍ය සම්පත් හැකිතාක් කාර්යක්ෂමව හා සඵලදායීව භාවිතා කිරීම අවශ්‍ය වේ. ආර්ථික සංවර්ධන ක්‍රියාවලියේදී රජය සහ පුරවැසියන් අතර අන්‍යෝන්‍ය විශ්වාසයක් හා පොදු එකඟතාවක් ඇති කිරීමෙහි ලා කාර්යක්ෂම රාජ්‍ය මුදල් කළමනාකරණය කේන්ද්‍රස්ථානයක් ලෙස කටයුතු කරයි. රජයේ මුදල්වල විනිවිදභාවය සහ වගවීම තහවුරු කරමින් සහ රටේ පුරවැසියන් සඳහා වඩාත් හොඳ සේවාවක් ලබා දෙමින් දිගු කාලීන ආර්ථික සාර්ථකත්වය සහතික කිරීම සඳහාත්, සීමිත සම්පත් උපරිම කාර්යක්ෂමතාවයකින් භාවිතා කිරීම සඳහාත් රාජ්‍ය මූල්‍ය කළමනාකරණ ක්‍රමවේද, ක්‍රියාවලි සහ ආයතනවල ප්‍රතිසංස්කරණ සිදු කිරීම අවශ්‍ය වේ.

1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම

"රාජ්‍ය අංශයේ විනිවිදභාවය, වගවීම, හා සේවා සැපයීම වර්ධනය කිරීම සඳහා ශක්තිමත් රාජ්‍ය මූල්‍ය කළමනාකරණ නීති පද්ධති රාමුවක් සකස් කිරීම"

මෙහෙවර

"රාජ්‍ය අංශය තුල මහජන වගවීමට සහාය වන ආයතනික ක්‍රියාකාරීත්වයක් සහිත පුළුල් යහපාලන පරිසරයක් ශක්තිමත් කිරීම සඳහා රාජ්‍ය මූල්‍ය පද්ධති, පටිපාටීන් සකස්කිරීම, සමාලෝචනය, සංවර්ධනය, පසුවිපරම හා යාවත්කාලීන කිරීම."

අරමුණු

1. රාජ්‍ය අංශයේ ගණුදෙනුවල විනිවිදභාවය හා වගවීම තහවුරු කිරීම පිණිස රාජ්‍ය මූල්‍ය කළමනාකරණය පිළිබඳ ප්‍රතිපත්ති, ක්‍රමපද්ධති හා පටිපාටීන් සැකසීම, සංවර්ධනය, සමාලෝචනය, පසුවිපරම සහ යාවත්කාලීන කිරීම.

2. රාජ්‍ය මූල්‍ය සම්පත් ඵලදායිව සහ කාර්යක්ෂමව උපයෝජනය කිරීම සහතික කරනු පිණිස රාජ්‍ය ගිණුම් කාරක සභාවට අවශ්‍ය සහාය ලබා දීම සහ රාජ්‍ය අංශයේ යහපාලනය ප්‍රවර්ධනය කිරීම.

3. දැනට පවතින රජයේ ගාස්තු හා අයකිරීම් කටයුතු අධික්ෂණය, සමාලෝචනය කිරීම සහ පිරිවැය ඵලදායීතාව ඉහළ නංවන අයුරින් බදු නොවන ආදායම් ඉපැයීමේ හැකියාව පිළිබඳව සොයා බැලීම.

4. මහජන මුදල් ඵලදායිව සහ කාර්යක්ෂම ලෙස යෙදවීම සහතික කරනු පිණිස, විවිධ අරමුණු උදෙසා අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු යටතේ පිහිටුවා ඇති අරමුදල් භාවිතය විධිමත් කිරීම, අරමුදල් කටයුතු සමාලෝචනය සහ අධීක්ෂණය කිරීම.

1.3. ප්‍රධාන කාර්යයන්:

i. රාජ්‍ය මූල්‍ය කළමනාකරණ ක්ෂේත්‍රයේ ප්‍රතිපත්ති, ක්‍රියාපටිපාටි සහ භාවිතයන් සකස් කිරීම, සංවර්ධනය කිරීම, ප්‍රවර්ධනය කිරීම, සමාලෝචනය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පසු විපරම් කිරීම.

ii. රාජ්‍ය ආයතනවල කාර්යයන් පරීක්ෂා කිරීමේදී රාජ්‍ය ගිණුම් කාරක සභාවට සහාය වීම සහ භාණ්ඩාගාර සටහන් නිකුත් කිරීම ඇතුළු රාජ්‍ය ගිණුම් කාරක සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පසුවිපරම් ක්‍රියාමාර්ග ගැනීම.

iii. විගණකාධිපතිවරයාගේ වාර්තා සහ විගණන විමසුම් අනුව පසුවිපරම් ක්‍රියාමාර්ග ගැනීම.

iv. දෙපාර්තමේන්තු ගාස්තු සහ අයකිරීම් සමාලෝචනය කර අවශ්‍ය විට සංශෝධන යෝජනා කිරීම.

v. මුදල් රෙගුලාසි 104 සහ 113 ප්‍රකාරව කපා හැරීම් සහ අත්හැරීම් සඳහා වන ඉල්ලීම් පරීක්ෂා කිරීම.

vi. විවිධ අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු යටතේ පවත්වාගෙන යනු ලබන අරමුදල්වල ක්‍රියාකාරිත්වය සමාලෝචනය සහ අධීක්ෂණය.

vii. අමාත්‍යාංශ මඟින් ඉදිරිපත් කරනු ලබන අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා දෙපාර්තමේන්තුවට අදාල විෂයපථයන් සම්බන්ධයෙන් වන නිරීක්ෂණ මුදල් අමාත්‍යවරයා වෙත ලබා දීම

viii. රාජ්‍ය ප්‍රසම්පාදනයේදී මුදලට සරිලන වටිනාකම, විවෘත හා ඵලදායී තරඟකාරිත්වය, ආචාරධර්ම සහ සාධාරණ ගනුදෙනු, විනිවිදභාවය සහ වගවීම සහතික කිරීම සඳහා

භාණ්ඩ, වැඩ සහ උපදේශන සේවා ප්‍රසම්පාදනය සඳහා රජයේ ප්‍රසම්පාදන උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ජාතික ප්‍රසම්පාදන කොමිසමට සහාය වීම සහ අවශ්‍ය නිර්දේශ ලබාදීම

ix. ඉහළ මට්ටමේ ප්‍රසම්පාදන කමිටු හා එයට සහාය වන ලංසු ඇගයීමේ කමිටු පත් කිරීම

x. රාජ්‍ය ආයතනවල ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් පිළිබඳ තොරතුරු ඇතුළත් දත්ත පද්ධතියක් යාවත්කාලීන කරමින් පවත්වාගෙන යාම


xi. විද්‍යුත් රාජ්‍ය ප්‍රසම්පාදන පද්ධතියට (e-GP) අදාළ සංවර්ධන කටයුතු සිදු කිරීම

xii. විදේශ තානාපති කාර්යාල සහ රාජ්‍ය තාන්ත්‍රික දූත මණ්ඩල විසින්, තීරු බදු රහිතව මෙරටට ආනයනය කරන ලද වාහන අපහරණය කිරීම සම්බන්ධයෙන් විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය, ශ්‍රී ලංකා රේගුව සහ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව සම්බන්ධීකරණය කරගනිමින් අවශ්‍ය කටයුතු සිදු කිරීම.

xiii. රජයේ මූල්‍ය දැක්ම තුළ රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේදී මුදල් අමාත්‍යවරයාගේ කාර්යයන්ට සහාය වීම.

1.4. සංවිධාන සටහන

ආයතනික සංවිධාන ව්‍යූහය (2024.12.31 දිනට අනුමත කාර්ය මණ්ඩලය)



1.4 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

1. මුදල් රෙගුලාසි, පසුවිපරම් හා සමාලෝචන සහ අරමුදල් අංශය
2. ඉඩම් අංශය
3. ප්‍රසම්පාදන අංශය
4. පාලන, ධාරිතා සංවර්ධන සහ පුහුණු අංශය

1.5 අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/ පළාත් සභාව යටතේ පවතින ආයතන/ අරමුදල්

- අදාළ නොවේ -

1.6 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු (තිබේ නම්)

යුරෝපා සංගමයෙන් සහ ප්‍රංශ රජයේ Agence Francaise De Development ආයතනයෙන් (EU සහ AFD) ලැබුණු ඇමරිකානු ඩොලර් මිලියන 4 ක මූල්‍ය ආධාර යටතේ 2023 ජූලි මස ලෝක බැංකුව සමඟ ආධාර ගිවිසුමක් අත්සන් කරන ලදී. මේ හරහා සිදු කරන ශ්‍රී ලංකාවේ රාජ්‍ය මූල්‍ය කළමනාකරණය සහ වගවීම ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය මෙම දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන අතර එමඟින් විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතිය (e-GP) වැඩිදියුණු කර ක්‍රියාත්මක කරනු ලබයි.

02. පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් රාජ්‍ය අංශයේ ආයතනවල මූල්‍ය පාලනය සඳහා පවතින විධිවිධාන වලට අනුකූල වීම, විනිවිදභාවය, වගවීම හා සේවා ලබා දීම වර්ධනය කරන වඩාත් යහපත් වූ රාජ්‍ය මූල්‍ය නියාමන රාමුවක් පවත්වා ගැනීම සඳහා රාජ්‍ය අංශයේ මූල්‍ය පාලනය සම්බන්ධ මධ්‍යගත කාර්යභාරයක් ඉටු කරනු ලබයි. ඒ අනුව, දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති කාර්යයන් අතුරින් 2024 වර්ෂය තුළ ප්‍රධාන වශයෙන් පහත සඳහන් කාර්යයන් ඉටු කර ඇත.

02. රටේ දිගුකාලීන අවශ්‍යතාවයක්ව පැවති රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත, භාණ්ඩාගාර දෙපාර්තමේන්තුවල ද සහයෝගය ඇතිව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුවේ (Fiscal Affairs Department of the International Monetary Fund) ප්‍රතිපත්තිමය මාර්ගෝපදේශ යටතේ 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත ලෙස 2024.08.08 දින පාර්ලිමේන්තුවේ දී සම්මත කරන ලදී.

03. වඩා යහපත් වූ සාර්ව ආර්ථික කළමනාකරණයක් උදෙසා මූල්‍ය ප්‍රතිපත්තිය වැඩි දියුණු කිරීමේ අරමුණ ඇතිව රාජ්‍ය මූල්‍ය කළමනාකරණ ව්‍යුහය තුළ රාජ්‍ය අරමුදල් පිළිබඳ වගවීම, අධීක්ෂණය, කළමනාකරණය සහ පාලනය ශක්තිමත් කිරීම සඳහා විධිවිධාන සැලැස්වීමටත්, මූල්‍ය කළමනාකරණයට අදාළ ආයතනික වගකීම් පැහැදිලි කිරීමටත්, අයවැය කළමනාකරණය ශක්තිමත් කිරීමටත්, මූල්‍ය ප්‍රතිපත්තිය සහ කාර්යසාධනය මහජනතාව විසින් සුපරීක්ෂණයට ලක්කිරීම සඳහා පහසුකම් සැලැස්වීමටත් මෙම පනත සම්මත කර ඇත. මෙම පනත සම්මත කිරීමෙන් 1971 අංක 38 දරන මුදල් පනතේ II වන කොටසේ 8 වන හා 14 වන වගන්ති අහෝසි වීමත්, 2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම) පනත අහෝසි වීමත් සිදුව ඇත.

04. මෑත කාලීනව රට මුහුණ දී තිබෙන බොහෝ මූල්‍ය දුෂ්කරතා විසඳීම සඳහා තීරණාත්මක වන පූර්ව අවශ්‍යතා ලෙස හඳුනාගෙන ඇති නෛතිකව ශක්තිමත් සහ දැඩි ලෙස බලාත්මක කළ හැකි මූල්‍ය නීති රාමුවක් පැවතීම සහ රාජ්‍ය ආයෝජන කළමනාකරණ යාන්ත්‍රණයක් පැවතීම වැනි නව ක්ෂේත්‍ර සඳහා විධිවිධාන සැලසීම කෙරෙහි ද රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත මඟින් අවධානය යොමු කරන ලදී. මෙම පනත සම්මත වීමෙන් පසුව එහි පවතින ප්‍රතිපාදන බලාත්මක කිරීම සඳහා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් පියවරයන් කිහිපයක් ගන්නා ලදී. එම පියවරයන් අතර රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත රාජ්‍ය ආයතන ප්‍රධානීන්ට හඳුන්වා දීම සඳහා 2024.08.15 දිනැතිව රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 3/2024 නිකුත් කිරීම සිදු කර ඇත.

05. රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත යටතේ රෙගුලාසි සකස් කිරීම සඳහා ප්‍රතිපත්තිමය මාර්ගෝපදේශ සැලසීම අරමුණු කරගෙන භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්වරු දෙදෙනෙකුගේ සමසභාපතීත්වය යටතේ විශේෂ කමිටුවක් පිහිටුවීමට භාණ්ඩාගාර ලේකම් විසින් පියවර ගන්නා ලදී. ඒ අනුව භාණ්ඩාගාර දෙපාර්තමේන්තු, දැනට පවතින මුදල් රෙගුලාසි සංග්‍රහය යටතේ විශේෂ රෙගුලාසි පවතින රාජ්‍ය අස්ථිත්ව හා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුවේ විශේෂඥයින්ගේ සහාය ඇතිව මුදල්

රෙගුලාසි සකස් කිරීමේ කටයුතු රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් සිදු කරමින් පවතී. එමෙන්ම රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත යටතේ ගරු මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යවරයාට පැවරී තිබූ යම් යම් බලතල භාණ්ඩාගාර ලේකම්වරයාට පැවරීම සඳහා වන ගැසට් පත්‍රය ප්‍රකාශයට පත් කරන ලද අතර, භාණ්ඩාගාර ලේකම් වෙත රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත යටතේ පැවරී ඇති බලතල, භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්වරුන් හා අදාල භාණ්ඩාගාර දෙපාර්තමේන්තුවල අධ්‍යක්ෂ ජනරාල්වරුන් වෙත පැවරීම සඳහා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව කටයුතු කරමින් පවතී.

06. රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතට අනුව ව්‍යවස්ථාපිත හා ව්‍යවස්ථාපිත නොවන අරමුදල් නියාමනය කිරීම සම්බන්ධයෙන් සුවිශේෂී කාර්යභාරයක් මෙම දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇත. එකී පනතට අනුව භාණ්ඩාගාරයේ ලේකම්වරයා විසින් සියලු ව්‍යවස්ථාපිත අරමුදල් සුපරීක්ෂණය කිරීම, පරීක්ෂා කිරීම සහ අධීක්ෂණය කිරීම කරනු ලැබිය යුතු අතර, එවැනි කාරණා සඳහා වෙනත් යම් ලිඛිත නීතියක් මගින් විධිවිධාන සලස්වනු නොලබන ව්‍යවස්ථාපිත අරමුදල් සම්බන්ධයෙන් විධාන නිකුත් කරනු ලැබිය හැකි ය. එසේම මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට යම් ව්‍යවස්ථාපිත නොවන අරමුදලක් ඒවායේ ක්‍රියාකාරීත්වය අවසන් කළ යුතු අතර, මේ පනත ක්‍රියාත්මක වීමේ දින සිට එක් වර්ෂයක් ඇතුළත එම අරමුදල් විසුරුවා හරිනු ලැබිය යුතු ය. එසේ වුව ද යම් ව්‍යවස්ථාපිත නොවන අරමුදලක් දිගටම පවත්වාගෙන යා යුතු බවට භාණ්ඩාගාර ලේකම්වරයා විමසා ගරු මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා තීරණය කරනු ලැබුවහොත් එම අරමුදල ව්‍යවස්ථාපිත අරමුදලක් බවට පත් කළ හැකිය.

07. තව ද ව්‍යවස්ථාපිත හා ව්‍යවස්ථාපිත නොවන අරමුදල් සම්බන්ධයෙන් මෙම දෙපාර්තමේන්තුව විසින් "2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ VIII වන කොටසේ 39 වැනි වගන්තිය යටතේ ප්‍රකාශිත ව්‍යවස්ථාපිත අරමුදල් පිළිබඳ විධිවිධාන ක්‍රියාත්මක කිරීම" යන මැයෙන් 2024.11.06 දිනැතිව රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 4/2024 නිකුත් කර ඇත. එකී චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන පරිදි ව්‍යවස්ථාපිත නොවන අරමුදල් සම්බන්ධයෙන් අමාත්‍යාංශ ලේකම්වරුන් විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සමාලෝචනය කොට ව්‍යවස්ථාපිත නොවන අරමුදල් සම්බන්ධයෙන් ගරු මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා වෙත නිර්දේශ ලබා දීම සඳහා භාණ්ඩාගාර ලේකම්ට නිර්දේශ ලබා දීමට නියෝජ්‍ය භාණ්ඩාගාර ලේකම්වරුන් දෙදෙනෙකුගේ සමසභාපතීත්වයෙන් යුත් කමිටුවක් පත් කර ඇත. එසේම එම පනතේ 39 වන වගන්තිය ප්‍රකාරව ව්‍යවස්ථාපිත හා ව්‍යවස්ථාපිත නොවන අරමුදල්වල කටයුතු විධිමත් කිරීම සම්බන්ධයෙන් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු සහ ඒ යටතේ ඇති ආයතනවල නිලධාරීන් කැඳවා දැනුවත් කිරීමේ රැස්වීම් පවත්වා ඇත.

08. 2024 වර්ෂය සඳහා පහත සඳහන් චක්‍රලේඛ නිකුත් කිරීමට කටයුතු කර ඇත.

(i)."විද්‍යුත් රාජ්‍ය ප්‍රසම්පාදන (e-GP) පද්ධතිය ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීම" යන මැයෙන් 2024.02.06 දිනැතිව නිකුත් කරන ලද අංක 08/2019(ii) දරන චක්‍රලේඛය

(ii). "ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංශෝධන" යන මැයෙන් 2024.03.01 දිනැතිව නිකුත් කරන ලද අංක 01/2024 දරන චක්‍රලේඛ ලිපිය

(iii). 1992 මුදල් රෙගුලාසි සංග්‍රහයේ සහ 2020.08.28 දිනැති රාජ්‍ය මුදල් වක්‍රලේඛ අංක 01/2020හි විධිවිධාන සංශෝධනය කිරීම සඳහා නිකුත් කරන ලද වක්‍රලේඛ

(අ). මු.රෙ. 113 - වෙනත් අත්හැර දැමීම් සහ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුම යටතේ ලබාදෙන ණය හා අත්තිකාරම් අත්හැර දැමීම (2024.05.29 දිනැති අංක 01/2024 දරන වක්‍රලේඛය)

(ආ). මු.රෙ. 104 සහ මු.රෙ. 108 හි විධිවිධාන සංශෝධය කිරීම (2024.05.29 දිනැති අංක 02/2024 දරන වක්‍රලේඛය)

(ඇ). රාජ්‍ය ආයතන විසින් මහජනයා වෙත සේවා සම්පාදනය කිරීමේදී අයකරනු ලබන ගාස්තු සංශෝධනය (2024.05.31 දිනැති අංක 1/2020(III) දරන වක්‍රලේඛය)

(ඈ). රජයට අවශ්‍ය හදිසි සේවා ඉටු කිරීම වෙනුවෙන් ගාස්තු ගෙවීම (2024.08.30 දිනැති අංක 01/2020(IV) දරන වක්‍රලේඛය)

(iv). "2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම" යන මැයෙන් 2024.08.15 දිනැතිව නිකුත් කරන ලද අංක 03/2024 දරන වක්‍රලේඛය

(v). "2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ VIII කොටසේ 39 වැනි වගන්තිය යටතේ ප්‍රකාශිත ව්‍යවස්ථාපිත අරමුදල් පිළිබඳ විධිවිධාන ක්‍රියාත්මක කිරීම" යන මැයෙන් 2024.11.06 දිනැතිව නිකුත් කරන ලද අංක 04/2024 දරන වක්‍රලේඛය

09. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 74 ව්‍යවස්ථාව හා පාර්ලිමේන්තු ස්ථාවර නියෝග 119 ප්‍රකාරව පිහිටුවා ඇති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ 2024 වර්ෂයේ පවත්වන ලද රැස්වීම් 28ක් සඳහා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සහභාගී වෙමින් කාරක සභාවට අවශ්‍ය සහය ලබාදෙන ලදී. තවද රාජ්‍ය ආයතන වලට අදාළව විගණකාධිපතිවරයා විසින් නිකුත් කරන විගණන විමසුම් හා විගණන වාර්තා පිළිබඳව අවධානය යොමු කොට රාජ්‍ය මූල්‍ය කලමනාකරණයේ දුර්වලතා නිවැරදි කිරීම සඳහා අවශ්‍ය පියවර ගන්නා ලෙස ඒ ඒ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතන වල ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්ට හා ගණන්දීමේ නිලධාරීන්ට දන්වමින් පසු විපරම් කටයුතු 2024 වර්ෂය තුළදී සිදු කර ඇත.

10. රාජ්‍ය මුදල් කළමනාකරණ පනතේ 7 වන වගන්තිය යටතේ සහ මු.රෙ. 124, 125(1) හා 125(2) යටතේ ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්, ගණන්දීමේ නිලධාරීන් හා ආදායම් ගණන්දීමේ නිලධාරීන් පත් කිරීමට අවශ්‍ය කටයුතු රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී.

11. අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා අනෙකුත් රජයේ ආයතන විසින් 1992 මුදල් රෙගුලාසි සංග්‍රහයේ 2 පරිච්ඡේදයේ 3 වන කොටසෙහි පාඩු හා අත්හැර දැමීම යටතේ කටයුතු කිරීමෙන් අනතුරුව මු.රෙ. 108 (3) යටතේ කපා හැරීම සඳහා භාණ්ඩාගාරය වෙත යොමු කරන ලද අවස්ථා සහ මු.රෙ.113 යටතේ අත්හැරීමට යොමු කරන ලද අවස්ථා සඳහා 2024 වර්ෂයේ ඉල්ලීම් 07 කට අදාළ භාණ්ඩාගාර අනුමැතිය ලබා දීමට කටයුතු කර ඇත.

12. විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද අංක 2/92 දරන රාජ්‍ය දූත මණ්ඩල වක්‍රලේඛයේ විධිවිධාන පරිදි රාජ්‍ය තාන්ත්‍රික දූත මණ්ඩල විසින් භාවිතා කරන ලද වාහන අපහරණය කිරීමේදී රජයට ගෙවිය යුතු තීරු බදු මුදල පිළිබඳ කටයුතු කිරීම රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති අතර

2024 වර්ෂයේදී විදේශ දූත මණ්ඩල විසින් අපහරණය කරන ලද වාහන 64 ක් සඳහා වූ ආදායම ලෙස රු.157,364,641.00 ක මුදලක් ශ්‍රී ලංකා රේගුව මඟින් අය කොට රාජ්‍ය ආදායමට බැර කොට ඇත.

13. විවිධ විෂයන් යටතේ ගරු අමාත්‍යවරුන් විසින් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලබන අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා ගරු මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගේ නිරීක්ෂණ ලබා දීම මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් සිදු කරනු ලබයි. ඒ අනුව 2024 වර්ෂය සඳහා අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද ප්‍රසම්පාදන, රජයේ විවිධ අරමුදල්, මුදල් රෙගුලාසි හෝ රාජ්‍ය මුදල් කලමනාකරණ විෂයන්ට සම්බන්ධ අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිරීක්ෂණ හා නිර්දේශයන් ලබා දීම සිදු කරන ලද අතර, 2024 වර්ෂය තුළ අමාත්‍ය මණ්ඩල සංදේශ 477 ක් සඳහා නිරීක්ෂණද, අමාත්‍ය මණ්ඩල සංදේශ 139 ක් සඳහා නිර්දේශ ද ලබා දී ඇත.

14. ප්‍රසම්පාදන ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරනු ලබන ස්ථාවර ප්‍රසම්පාදන කමිටු (SCAPCs) 57 ක් ද, අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරනු ලබන ප්‍රසම්පාදන කමිටු (CAPCs) 39 ක් ද, අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරනු ලබන සාකච්ඡා සම්මුති කමිටු (CANCs) 56 ක් ද, අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරනු ලබන ස්ථාවර සාකච්ඡා සම්මුති කමිටු (SCANCs) 04 ක් ද, අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරනු ලබන විශේෂ ස්ථාවර ප්‍රසම්පාදන කමිටු (SSCAPCs) 04 ක් ද, ව්‍යාපෘති කමිටු (PCs) 48 ක් ද, තාක්ෂණික ඇගයීම කමිටු (TECs) 20 ක් ද, අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරනු ලබන උපදේශක ප්‍රසම්පාදන කමිටු (CPCCs) 25 ක් ද, සඳහා 2024 වර්ෂය තුළදී රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් පත් කිරීම් සිදු කර ඇත.

15. රජයේ ප්‍රතිපත්ති තීරණ අනුව රාජ්‍ය මූල්‍ය කළමනාකරණයට අදාල කාර්යයන් තවදුරටත් විධිමත් කරමින් වර්තමානයට ගැලපෙන පරිදි, කාලානුරූපීව රාජ්‍ය මූල්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් වූ විධිවිධාන යාවත්කාලීන කිරීමට කටයුතු කිරීම සහ රාජ්‍ය මූල්‍ය කළමනාකරණය සඳහා අවශ්‍යය මගපෙන්වීම් ලබාදීම ඉදිරි වර්ෂ වලදී රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරනු ලබන ක්‍රියාමාර්ගයන් වේ.

ඊ.ඒ. රත්නසීල
රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්

03. පරිච්ඡේදය - 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසිඒ-එල්

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2024 රු.		සටහන	කළඹ 2024 රු.	කළඹ 2023 රු.	
-	ආදායම් ලැබීම්		-	-	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒසිඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	මුළු ආදායම් ලැබීම් (අ)		-	-	
-	ආදායම් නොවන ලැබීම්		-	-	
-	භාණ්ඩාගාර අයිතම		89,129,000	97,172,000	ඒසිඒ-3
-	කැන්පතු		389,152	406,639	ඒසිඒ-4
-	අත්තිකාරම් ගිණුම්		6,056,482	6,755,435	ඒසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		**95,574,634**	**104,334,074**	
	මුළු ආදායම් ලැබීම් සහ ආදායම්				
-	නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		**95,574,634**	104,334,074	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		-	608,000	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම්				
	නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)		**95,574,634**	**103,726,074**	
	අඩු කළා : වියදම්				
-	පුනරාවර්තන වියදම්				
70,150,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	67,134,233	62,682,248	
27,350,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	23,680,693	19,937,470	ඒසිඒ-2(ii)
1,450,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	1,074,478	967,424	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	
98,950,000	මුළු පුනරාවර්තන වියදම් (ඊ)		**91,889,404**	**83,587,142**	
	මූලධන වියදම්				
900,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	428,000	883,868	
4,950,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	4,865,817	6,523,035	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	ඒසිඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	13	-	-	
1,000,000	හැකියා වර්ධනය	14	496,000	449,473	
420,000,000	වෙනත් මූලධන වියදම්	15	75,283,989	11,640,606	
426,850,000	මුළු මූලධන වියදම් (උ)		**81,073,806**	**19,496,982**	
	කැන්පතු ගෙවීම්		389,152	406,639	ඒසිඒ-4
	අත්තිකාරම් ගෙවීම්		5,270,504	4,274,588	ඒසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		**5,659,656**	**4,681,227**	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		**178,622,866**	**107,765,351**	
525,800,000	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)		**(83,048,232)**	**(4,039,277)**	
	අයවැය ප්‍රතිපාදන ප්‍රකාශනය අනුව ශේෂය		(83,048,232)	(4,039,277)	ඒසිඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-	-	ඒසිඒ-3
			(83,048,232)	**(4,039,277)**	

2025-02-21
පී.කේ. වරාෂා අමන්දිමාලි
රාජ්‍ය මුදල් නියෝජ්‍ය අධ්‍යක්ෂ
රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01.

1

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පී

2024 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	කත්‍ය 2024 රු.	2023 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	64,004,968	64,059,319
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	8,808,631	9,594,609
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	-	-
මුළු වත්කම්		**72,813,599**	**73,653,928**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		8,808,631	9,594,609
දේපළ පිරියත හා උපකරණ සංචිතය		64,004,968	64,059,319
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසීඒ-5(බී)		
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසීඒ-4	-	-
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	-	-
මුළු වගකීම්		**72,813,599**	**73,653,928**

පිටු අංක 07 සිට 31 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 32 සිට 37 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. **මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2024.12.16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024** විධිවිධානයන්ට අනුකූලව සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර :
දිනය : 2025.02.28
කේ.එම්.මහින්ද සිරිවර්ධන
මහා භාණ්ඩාගාරයේ සහ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්
මුදල් අමාත්‍යාංශය
කොළඹ 01.

.....
ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර :
දිනය : 2025.02.21
ඊ.ඒ. රත්නසිල
රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්
රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01.

.....
ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම :
දිනය : 2025-02-21
පී.කේ. එරාෂා හංසිනී
රාජ්‍ය මුදල් නියෝජ්‍ය අධ්‍යක්ෂ
රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01.

3.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ඒසිඒ-සී

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	තත්‍ය	
	2024 රු.	2023 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	9,961,749	6,064,660
අග්‍රිම ලැබීම්	89,129,000	97,172,000
අත්තිකාරම් අයකර ගැනීම්	4,949,201	5,991,864
තැන්පතු ලැබීම්	389,152	406,639
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**104,429,102**	109,635,163
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	90,533,951	82,177,580
සහනාධාර සහ මාරුකිරීම්	1,074,478	967,424
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	795,897	13,218,903
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම්	-	608,000
අත්තිකාරම් ගෙවීම්	5,177,507	4,400,241
තැන්පතු ගෙවීම්	389,152	406,639
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**97,970,985**	101,778,787
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**6,458,117**	7,856,376
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
භූමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම්	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
මූලධන වියදම්	6,458,117	7,856,376
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**6,458,117**	7,856,376
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**(6,458,117)**	(7,856,376)
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	

2025-02-21
පී.කේ. වීරාෂා හංසිනී
රාජ්‍ය මුදල් නියෝජ්‍ය අධ්‍යක්ෂ
රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01.

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

වාර්තා කිරීමේ පදනම

1) පිළියෙල කිරීමේ අරමුණ

මූල්‍ය ප්‍රකාශන, රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2024.12.16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 විධිවිධානයන්ට අනුකූලව පිළියෙල කර ඇත.

2) වාර්තාකරණ කාලපරිච්ඡේදය

2024 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

3) මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

4) ආදායම් හඳුනාගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

5) දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

6) දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම් දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම් වේ.

7) මුදල් හා මුදල් සමාන දෑ

2024 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

* යම් වාර්තාකරණ ආයතනයකට විශේෂිත වූ ගනුදෙනු ඇති අවස්ථාවල දී එම ආකෘතිවල අවශ්‍ය පරිදි සංශෝධනයන් සිදුකර ගත හැක. එසේම "වාර්තාකරණ පදනම" යටතේ එම විශේෂිත ගනුදෙනු සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම් ඇතුළත් කළ හැක.

* තම වාර්තාකරණ ආයතනයට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති පමණක් වාර්තාකිරීමේ පදනම යටතේ හෙළිදරව් කළ යුතු ය.

2025-02-21

පී.කේ. වීරාෂා හංසිනී
රාජ්‍ය මුදල් නියෝජ්‍ය අධ්‍යක්ෂ
රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01.

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

රු.

ආදයම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
		අදාළ නොවේ			

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු.

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	96,000,000.00	98,950,000.00	91,889,404.42	92.86%
ප්‍රාග්ධන	426,850.000.00	426,850,000.00	81,073,805.94	18.99%

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු.

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදනවල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
		අදාළ නොවේ				

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු.

වත්කම් කේතය	කේත විස්තරය	2024.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	2024.12.31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	3,956,900.00	3,956,900.00		100%
9152	යන්ත්‍රෝපකරණ	60,048,068.28	60,048,068.28		100%
9153	ඉඩම්	-	-		-
9154	අස්පෘශ්‍ය වත්කම්	-	-		-
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-		-
9160	කෙරීගෙන යන වැඩ	-	-		-
9180	බදු දෙන ලද වත්කම්	-	-		-
		64,004,968.28	**64,004,968.28**		

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. TPD/E/DPF/FA/24/13
ඔබේ අංකය உமது இல. Your No.
දිනය திகதி Date 2025 මැයි දින





ගණන්දීමේ නිලධාරී
රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව

ශීර්ෂය 245 - රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශීර්ෂය 245 - රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී ඉදිරිපත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

(අ) සමාලෝචිත වර්ෂයේදී පුනරාවර්තන වැය විෂය අංක 245-1-1-0-1003 සඳහා එකතුව රු.2,950,000 ක ප්‍රතිපාදන හෙවත් මූලික ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයෙන් සියයට 14 ක ප්‍රතිශතයක් පරිපූරක ඇස්තමේන්තු මගින් අතිරේක ප්‍රතිපාදන ලබා ගෙන තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී පුනරාවර්තන වැය විෂයයන් 04 ක ප්‍රතිපාදනයෙන් එකතුව රු.6,382,000 ක ප්‍රමාණයක් සියයට 10 සිට 28 දක්වා පරාසයකින් ප්‍රතිපාදන අඩු කිරීම් ද පුනරාවර්තන වැය විෂයයන් 05 ක එකතුව රු. 6,382,000 ක ප්‍රමාණයක් සියයට 1 සිට

300 දක්වා පරාසයකින් ප්‍රතිපාදන වැඩි කිරීම් ද මුදල් රෙගුලාසි 66/69 මඟින් මාරු කිරීම් සිදු කර තිබුණි.

(ඇ) සැලසුම් කරන ලද කාර්යයන් ඉටු කිරීමට පුනරාවර්තන හා මූලධන වැය විෂයයන් 10 ක් සඳහා සලසා තිබූ එකතුව රු. 424,867,890 ක ප්‍රතිපාදන වලින් එකතුව රු.347,172,746ක් වූ ප්‍රතිපාදන ඉතිරි කර තිබූ අතර එම ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 34 සිට සියයට 100ක් දක්වා වූ පරාසයක පැවතුණි.

3.2 බැරකම් හා බැදීම් වලට එළඹීම

(අ) 2024 වර්ෂයේ දෙසැම්බර් මාසයට අදාල අතිකාල වියදම් රු.71,713 ක් 2025 වර්ෂයේ ජනවාරි මාසයේ දී 245-1-1-1002 වැය විෂය යටතේ ගෙවීම් කර පවත්නා වර්ෂයේ ගිණුම් ගත බැදීම් යටතේ ගිණුම් ගත කර තිබුණද එම වියදම 2024 වර්ෂයේ බැරකම් ප්‍රකාශයේ ඇතුලත් කර නොතිබුණි.

(ආ) 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන තුල අඩංගු විය යුතු ඇමුණුම් IV බැරකම් පිළිබඳ ප්‍රකාශය I ආකෘති පත්‍රය මූල්‍ය ප්‍රකාශන තුල ඇතුලත් කර ගිණුම් වර්ෂයට අදාල මු.රෙ.94 (2) සහ (3) ප්‍රකාරව එළඹෙන ලද බැරකම් සඳහන් කල යුතු වුවත්, එසේ කටයුතු කර නොතිබුණි.

3.3 ගණන්දීමේ නිලධාරි විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදුකර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

3.4 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම

ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 3:6 වගන්තිය අනුව නිලධරයෙකුට දෙන සියළුම ණය එක් මුදලක් ලෙස ඒකාබද්ධ කළ යුතු අතර, ණය ආපසු අයකරගැනීමේ වාරික ගණන් බැලිය යුත්තේ මාස දහයක වැටුප හෝ ඊට අඩු ණය ප්‍රමාණයක් නම් මාසික වැටුපෙන් 10% ක ප්‍රතිශතයකි. ආපදා ණය ලබා ගත් නිලධාරියකුගේ ආපදාණය මුදලින් අයවිය යුතු වාරිකය රු.3,035 ක් වුව ද, 2024 වර්ෂය තුලදී ජනවාරි මස රු.3,660 ක් ද, පෙබරවාරි සිට ඔක්තෝබර් දක්වා රු.2,186 බැගින් ද, නොවැම්බර් හා දෙසැම්බර් යන මාසයන්හි දී රු.3,035 යනාදී ලෙස වාරික අය කිරීමෙන් එකතුව රු.7,016 ක ණය වාරික අඩුවෙන් අයකර තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 කාර්යභාරයන් ඉටු කිරීම

(අ) 2018 අගෝස්තු 18 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය මුදල් වක්‍රලේඛය හා 2024 අංක 44 දරණ රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ විධිවිධාන අනුව ව්‍යවස්ථාපිත නොවන අරමුදල් 13ක් වසා දැමීමට නිර්දේශ කර තිබුණ ද, ඉන් අරමුදල් 11ක කටයුතු අවසන් කර වසා දමා තිබුණු නමුත් තවත් අරමුදල් 2ක් සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු අවසන් කර නොතිබුණි.

(ආ) 2019 නොවැම්බර් 25 දින e-GP පද්ධතිය සංවර්ධනය කිරීමේ මූලික ගිවිසුමට එළඹ තිබුණ ද, 2025 මාර්තු 31 දින වන විටත් මිල සැදැහුම් ක්‍රමය යටතේ පමණක් ලංසු කැඳවීමට පද්ධතිය සංවර්ධනය කර තිබුණු අතර e-GP පද්ධතිය හරහා ප්‍රසම්පාදන කටයුතු සිදුකිරීම අපේක්ෂිත ආයතන සංඛ්‍යාව මෙම පද්ධතියට ලියාපදිංචි කර ගැනීමේ කටයුතු අවසන් කර නොතිබුණි.

(ඇ) වෙළඳපළ මිල සැදැහුම් ක්‍රමය යටතේ ප්‍රසම්පාදන කටයුතු සඳහා e-GP පද්ධතිය භාවිතා කරන ලද ආයතන එම ක්‍රමය යටතේ සිදු කරන ලද සියලු ප්‍රසම්පාදන සඳහා මෙම පද්ධතිය යොදාගෙන නොගැනීමට බලපාන ලද හේතු දෙපාර්තමේන්තුව විසින් හඳුනාගෙන තිබුණද එම දුර්වලතා අවම කර e-GP පද්ධතියේ භාවිතය ප්‍රවර්ධනය කිරීමට මේ දක්වා දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

(ඇ) 2025 මාර්තු 31 දින වන විට ජාතික හා ජාත්‍යන්තර ලංසු කැඳවීම යටතේ භාණ්ඩ ප්‍රසම්පාදනයට හැකිවන ලෙස පද්ධතිය සැකසීමට සැලසුම් කර තිබුණද 2025 මාර්තු 31 දින වන විටත් එම කටයුතු අවසන් කර නොතිබුණි.

(ඉ) විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතිය සැකසීමේ කොන්ත්‍රාත්තුව සඳහා රු.71,500,000 කට නික්ෂණ ආයතනය සමඟ 2019 නොවැම්බර් 25 දින ගිවිසුම් ගත වී තිබුණද 2021 දෙසැම්බර් 31 වන විටත් කොන්ත්‍රාත්කරු ප්‍රමාණවත් කාර්යසාධනයක් පෙන්වා නොතිබුණි. එසේ තිබියදීත් මෙම පද්ධතියේ නව අනුවාදය නිර්මාණය සඳහා මුල් කොන්ත්‍රාත් වටිනාකමට රු.81,370,000 ක් ඇතුලත් කර රු.152,870,000 ක් වූ කොන්ත්‍රාත් වටිනාකමකට මාස 20 ක කාලයක් තුල පද්ධතිය සැකසීම සඳහා උක්ත කොන්ත්‍රාත් සමාගම සමඟ 2023 මාර්තු 22 දින මුල් කොන්ත්‍රාත්තුවට අතිරේකයක් අත්සන් කර තිබුණි. 2025 මාර්තු 31 දින වන විට ගිවිසුම්ගත දින සිට මාස 24 ක කාලයක් ගතවී ඇතත් පද්ධතිය සංවර්ධනයෙහි සැලකිය යුතු ප්‍රගතියක් අත් කර ගෙන නොතිබුණි.

4.1.2 ප්‍රසම්පාදනයන්

රාජ්‍ය ආයතන වෙත රාජ්‍ය විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතිය හඳුන්වා දීම පිළිබඳව වූ 2018 ඔක්තෝබර් 23 දිනැති අංක 05/2018 හා 2019 දෙසැම්බර් 17 දිනැති අංක 08/2019 දරන රාජ්‍ය මුදල් වක්‍රලේඛය ප්‍රකාරව රාජ්‍ය ප්‍රසම්පාදන අස්ථීත්ව ලියාපදිංචිය, සම්බන්ධීකරණ නිලධාරීන් ලියාපදිංචිය, සැපයුම්කරුවන් ලියාපදිංචිය, වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම ඉදිරිපත් කිරීම, ප්‍රසම්පාදන දැන්වීම් ප්‍රසිද්ධ කිරීම, මිල සැඳහුම් ක්‍රමයට විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතිය භාවිතා කිරීම ආදී කටයුතු රාජ්‍ය ආයතන විසින් සිදු කළ යුතු බව දක්වා තිබුණ ද 2024 වර්ෂයේදී අවස්ථා 04කදී එකතුව රු.446,577ක් වූ ප්‍රසම්පාදන අයිතමයන් විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතිය භාවිතයෙන් තොරව මිල සැඳහුම් ක්‍රමයට සපයාගෙන තිබුණි.

5. මානව සම්පත් කළමනාකරණය

දෙපාර්තමේන්තුවේ අනුයුක්ත කාර්ය මණ්ඩලය හා තත්‍ය කාර්ය මණ්ඩලය

සේවක වර්ගය	අනුමත සේවක සංඛ්‍යාව	තත්‍ය සේවක සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ මට්ටම	30	19	11
තෘතීයික මට්ටම	02	01	01
ද්විතීයික මට්ටම	42	26	16
ප්‍රාථමික මට්ටම	16	10	06
	90	**56**	**34**

දෙපාර්තමේන්තුවේ අනුමත තනතුරු 90 ක් වූ අතර, ඉන් තනතුරු 34 ක් හෙවත් මුළු තනතුරු වලින් සියයට 38ක් පුරප්පාඩුව පැවතුණි. ඉන් ජ්‍යෙෂ්ඨ මට්ටම තනතුරු 11 ක් ද, තෘතීයික මට්ටමේ තනතුරු 01 ක් ද, ද්විතීයික මට්ටමේ තනතුරු 16 ක් සහ ප්‍රාථමික මට්ටමේ තනතුරු 06 ක් ද වී තිබුණි.

ඩී.ජී.ඒ.එස්. අනුලසිරි
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

04. පරිච්ඡේදය – කාර්ය සාධන දර්ශක

ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100%- 90%	**75%-89%**	**50%- 74%**
උපදෙස් ලබා දීම සඳහා රාජ්‍ය මුදල් චක්‍රලේඛ නිකුත් කිරීම	√		
දෙපාර්තමේන්තුව වෙත යොමු කළ පැහැදිලි කිරීම් සඳහා පිළිතුරු සැපයීම	√		
සහභාගී වූ රාජ්‍ය ගිණුම් කාරක සභා රැස්වීම් සංඛ්‍යාව	√		
ගිණුම්කාරක සභාවේ මහ පෙන්වීම් පසු විපරම් කිරීම	√		
භාණ්ඩාගාර සටහන් නිකුත් කිරීම	√		
විගණකාධිපති වාර්තා නිරීක්ෂණ සම්බන්ධව පසු විපරම් කටයුතු	√		
රජයේ ගාස්තු හා අයකිරීම් සංශෝධනය	√		
පාඩු හා කපා හැරීම් සඳහා වන ඉල්ලීම් සඳහා නිර්දේශ සැපයීම	√		
රාජ්‍ය තාන්ත්‍රික දූත මණ්ඩල විසින් භාවිතා කරන ලද වාහන අපහරණය	√		
අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ සැපයීම	√		
ප්‍රසම්පාදන කමිටු, තාක්ෂණික ඇගයීම්	√		

කමිටු හා ව්‍යාපෘති කමිටු පත් කිරීම			
මූල්‍ය ප්‍රකාශන, වාර්තා නියමිත කාල පරිච්ඡේදය තුළ ඉදිරිපත් කිරීම	√		

05. පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු

ඉලක්කය / අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0%-49%	50%-74%	75%- 100%
සියල්ලන් සඳහාම පෝෂිත, සර්වග්‍රාහී හා තිරසරාත්මක ආර්ථික වර්ධනය, පූර්ණ හා ඵලදායී රැකියා සහ සැමට යහපත් ජීවනෝපායක් ප්‍රවර්ධනය කිරීම	සංවර්ධනය ඉලක්ක කරගත් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දිරිගැන්වීම	2024 අංක 24 දරන රාජ්‍ය මූල්‍ය කළමණාකරණ පනත බලාත්මක කිරීම, රාජ්‍ය මූල්‍ය කළමනාකරණය සඳහා උපදෙස් චක්‍රලේඛ නිකුත් කිරීම			√
	සංවර්ධනය ඉලක්ක කරගත් රාජ්‍ය ප්‍රසම්පාදන ප්‍රතිපත්ති දිරිගැන්වීම	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සඳහා වන උපදෙස් හා චක්‍රලේඛ නිකුත් කිරීම			√

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව රාජ්‍ය අංශයේ මූල්‍ය පාලනයට අදාළ වන රෙගුලාසි සකස් කිරීමේ මධ්‍යගත කාර්යභාරය ඉටුකරන ආයතනය වන අතර රාජ්‍ය අංශය තුළ මූල්‍ය භාවිතයේ විනිවිදභාවය, වගවීම වර්ධනය කරමින් යහපත් රාජ්‍ය මූල්‍ය විනයක් පවත්වාගෙන යාමට අවශ්‍ය පසුතලය නිර්මාණය කිරීමේ වගකීම සතු ආයතනයයි. රාජ්‍ය ආයතනවලින් සිදුවන ප්‍රසම්පාදන කාර්යයන්වලදී ඒවායේ විනිවිදභාවය හා වගවීම ප්‍රශස්ථ මට්ටමින් පවත්වාගෙන යාමට මාර්ගෝපදේශයන් ඉදිරිපත් කරමින් රාජ්‍ය මූල්‍ය ස්ථාවරත්වය පවත්වාගෙන යාමට වෙනත් රාජ්‍ය ආයතන සමඟ සම්බන්ධව කටයුතු කරන අතර දරිද්‍රතාවය පිටුදැකීම සඳහා රාජ්‍ය සම්පත් කළමනාකරණය වැඩිදියුණු කිරීම පිණිස සැලකිය යුතු දායකත්වයක් සපයයි.

පාර්ලිමේන්තුව වැනි ආයතනවලට වගවීම සම්බන්ධයෙන් විධිමත් පාලනයක් පවත්වාගෙන යාමට සහාය වෙමින් නෛතික පාලන ක්‍රමවේද ප්‍රවර්ධනය කරමින්, තිරසර සංවර්ධන අභිමතාර්ථ සාක්ෂාත් කර ගැනීමට පසුතලය සකස් කරමින්, රාජ්‍ය ආයතන තුළ වන නියාමනයන් හා මූල්‍ය උපදේශාත්මක සේවාවන් සපයනු ලබයි.

06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	තත්‍ය සේවක සංඛ්‍යාව	ඇබෑර්තු / (අතිරික්ත)**
ජ්‍යෙෂ්ඨ	30	19	11
තෘතීයික	02	01	01*
ද්විතියික	42	26	16*
ප්‍රාථමික	16	10	06*
වෙනත්/ අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත්	0	0	0
එකතුව	**90**	**56**	**34**

- ❖ භාෂා පරිවර්තක නිලධාරිනිය 2024.11.13 දින සිට 2029.04.04 දින දක්වා වැටුප් රහිත විදේශ නිවාඩු ලබා ඇත.

- ❖ සංවර්ධන නිලධාරිනියක් වැටුප් රහිත දේශීය නිවාඩු 2024.01.02 දින සිට 2029.01.01 දින දක්වා හා සංවර්ධන නිලධාරිනියක් වැටුප් රහිත විදේශීය නිවාඩු 2023.01.20 දින සිට 2028.01.19 දින දක්වා ලබා ඇත.

- ❖ කා.සේ.සේ. එක් සේවක මහත්මියක් 2023.01.17 දින සිට 2028.01.16 දින දක්වා වැටුප් රහිත දේශීය නිවාඩු ලබා ඇත.

6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයේ බලපෑම

යම්කිසි ආයතනයක නිසි පරිදි මානව සම්පත කළමනාකරණය කර ගැනීම ආයතනික අරමුණු හා අභිමතාර්ථ සාක්ෂාත් කර ගැනීමට අත්‍යාවශ්‍ය වන අතර ප්‍රතිපත්ති සකස් කිරීමේදී හා ක්‍රියාත්මක කිරීමේදී මානව සම්පත සතු ශක්‍යතාවයන් මනාව කළමනාකරණය කරගනිමින් උපරිමයෙන් භාවිත කිරීම තුළින් දෙපාර්තමේන්තු අරමුණු හා අභිමතාර්ථ සඵල කර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන ඇත.

6.3 මානව සම්පත් සංවර්ධනය

Name of the program	No. of Staff trained	Duration of the Program	Total Investment (Rs.)	Nature of the Program (Foreign/ Local)	Output/ Knowledge gained
Workshop on Business Writing	All DOS & MSOs of PFD	10 days	192,000.00	Local	-
The Speech craft Program	All Staff Grade Officers of PFD	10 days	200,000.00	Local	-
Roles & Responsibilities of Office Assistant	2 Office Assistants	2 days	20,000.00	Local	-
Scientific, Economical & Safe Driving	2 Drivers	2 days	12,000.00	Local	-

Name of the program	No. of Staff trained	Duration of the Program	Total Investment (Rs.)	Nature of the Program (Foreign/ Local)	Output/ Knowledge gained
Skills Development of Drivers	2 Drivers	2 days	20,000.00	Local	-
English Language Training Program	All DOS & MSOs of PFD	4 Days	52,000.00	Local	-
Public Finance Management Training Program	All officers of PFD	1 day	-	Local	-
e-GP capacity Building Program	All officers of PFD	2 days	-	Local	-
AI තාක්ෂණය(Artificial Intelligence) පිළිබඳ කාර්ය මණ්ඩල නිලධාරීන් දැනුවත් කිරීමේ පුහුණු පාඨමාලාව	Ms. U.R.V.D.S. Weerarathna/DO, Ms.H.M.C.K. Kmari/DO, Ms. P.W.S. Amarasena/DO	1day	-	Local	-
Training on Introduction to Financial programming and Policies	Ms. A.D.D Tharaka/AD, Ms. P.K.D.N. Kumari/AD	5 days	-	Local	-
Global Procurement Summit 2024	Mr. E.A. Rathnaseela/DG	2 days	-	Foreign	-
ADB: Government Communications Professional Forum	Mr. M.M. Noufal/ADG	3 days	-	Foreign	-
Board of Directors Meeting of Asian Infrastructure Bank (AIIB) March 2024	Mr. P.V.B.P. Sisiranandana/ DD	4 days	-	Foreign	-

Name of the program	No. of Staff trained	Duration of the Program	Total Investment (Rs.)	Nature of the Program (Foreign/ Local)	Output/ Knowledge gained
Sustainable/ Green Public Procurement Expert group meeting	Mr. E.A. Rathnaseela/DG	2 days	-	Foreign	-
Seminar on Digital Economy and Industry Integration under the Global Development Initiative	Ms. S.G. Pathirage/D	14 days	-	Foreign	-
Seminar for Young Diplomats from Sri Lanka	Ms. W.H.A. Wimalajeewa/D	14 days	-	Foreign	-
First Mid-Career Training Programme for Island Services Officers of Sri Lanka under the ITEC	Ms. W.K.D. Danstan/D, Ms. P.K. Erasha Hansini/ DD	11 days	-	Foreign	-
Seminar on Medium to Long-Term Development Planning for Development Countries	Ms. W. Mallika Perera/ AD	14 days	-	Foreign	-
Electronic Government Procurement (e-GP) System Development, Implementation and Rollout in Sri Lanka	Mr. E.A. Rathnaseela/DG Ms. K.A.W. Fernando/D, Ms. W.H.A. Wimalajeewa/D, Mr. B.J.L.S. Rodrigo/PM	3 days	-	Foreign	-

Name of the program	No. of Staff trained	Duration of the Program	Total Investment (Rs.)	Nature of the Program (Foreign/ Local)	Output/ Knowledge gained
Impact of Digital Money/ Central Bank Digital Currencies in Fiscal Operations	Mr. E.A. Rathnaseela/DG	4 days	-	Foreign	-
Seminar on Financing & Financial Cooperation Management for BRI Countries	Ms. C.H.Ranatunga/D	14 days	-	Foreign	-
Board of Directors Meeting of Asian Infrastructure Bank Constituency Meeting 2024 (June)	Mr. P.V.B.P. Sisiranandana/ DD	4 days	-	Foreign	-
ADB: Strengthening the Asia Pacific Public Electronic Procurement Network	Mr. P.S.S. Wijerathne/ ADG, Ms. K.A.W. Fernando	5 days	-	Foreign	-
A Knowledge exchange visit to the National Informatics Centre, New Delhi, India	Mr. E.A. Rathnaseela/DG Ms. K.A.W. Fernando/D, Ms. W.H.A. Wimalajeewa/D,	5 days	-	Foreign	-
Seminar on Financial Strategy for the BRI Partner Countries	Mr. M.M. Noufal/ADG	7 days	-	Foreign	-
Third East Asia Forum	Mr. E.A. Rathnaseela/DG	2 days	-	Foreign	-

Name of the program	No. of Staff trained	Duration of the Program	Total Investment (Rs.)	Nature of the Program (Foreign/ Local)	Output/ Knowledge gained
ADB: Strengthening the Asia Pacific Public Electronic Procurement Network, International Procurement Workshop	Ms. S.G. Pathirage/D	3 days	-	Foreign	-
Training on "Life Cycle Costing (LCC) within Sustainable Public Procurement (SPP)	Ms. W.H.A. Wimalajeewa/D,	4 days	-	Foreign	-
ADB: 2024 Regional Public Sector Accounting Forum	Mr. A.N. Hapugala/ADG	2 days	-	Foreign	-
Seminar on Application and Management of PPP Model for Sri Lanka	Mr. P.V.B.P. Sisiranandana/ DD	14 days	-	Foreign	-
ADB: South Asia Portfolio Forum 2024	Mr. J.M.U.P. Jayamaha/D	3 days	-	Foreign	-
IMF: SARTTAC Training on Fiscal Policy Analysis	Ms. Moratuwage Leelani/DO	13 days	-	Foreign	-
ITEC: Sharing the Indian Accounting Profession Story	Ms. K.G.S. Maduwanthi/ DD	12 days	-	Foreign	-
SARTTAC Training on Institutional Sector Accounts From	Ms. N.H.W.N.de Alwis/ D	8 days	-	Foreign	-

Name of the program	No. of Staff trained	Duration of the Program	Total Investment (Rs.)	Nature of the Program (Foreign/ Local)	Output/ Knowledge gained
Strengthening the Asia Pacific Public Electronic Procurement Network (Phase 2) 10th Conference the Asia Pacific Public Electronic Procurement Network	Mr. E.A. Rathnaseela/DG	3 days	-	Foreign	-

ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන දායක වන ආකාරය

සමස්ථ රාජ්‍ය යාන්ත්‍රණය ඩිජිටල්කරණය හා බද්ධව අනාගතයට රැගෙන යාමේදීත්, ගෝලීය ආර්ථික තත්ත්වයන් හඳුනාගෙන රාජ්‍ය යාන්ත්‍රණය මෙහෙයවීමේදීත්, කාර්යමණ්ඩලය සතුව ඒ හා සම්බන්ධ දැනුම සහ ධාරිතා සංවර්ධනය අත්‍යවශ්‍ය සාධකයක් වන අතර සේවක අභිප්‍රේරණයේදී දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන් මහඟු පිටුවහලක් වේ.

මෙම දෙපාර්තමේන්තුව සතුවිය යුතු විෂයානුබද්ධ මෙන්ම රාජ්‍ය සේවයට පොදු කරුණු සම්බන්ධ වූ පුහුණුව හා අත්දැකීම් දෙපාර්තමේන්තු කාර්යසාධනය කෙරෙහි සාධනීය බලපෑමක් ඇතිකරනු ලබයි.

07. පරිච්ඡේදය – අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාළ නොවේ		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ		
1.6	වෙනත්			
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මූ.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අදාළ නොවේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විගණනය**			

6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ		
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදු කොට තිබීම	අනුකූල වේ		

8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අදාළ නොවේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම.	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අදාල නොවේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නෙඉක්මවන පරිදි බැරකම්වලට එලඹීම	අනුකූල වේ		

12	**රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්ට වලට අනුකූල වීම.	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අදාළ නොවේ		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම.	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල වේ		
15.2	රැස් කර තිබූ ආදයම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අදාළ නොවේ		
15.3	මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අදාළ නොවේ		

16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ		

19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ		
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		